ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
University of Sri Jayewardenepura
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit

| | | | |
|---|---|---|---|
| මගේ අංකය My Number | USJP/EDU/12/2025 | ලිපිනය Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල Post Box 10, Gangodawila නුගේගොඩ, ශ්‍රී ලංකා Nugegoda, Sri Lanka , |
| ඔබේ අංකය Your Number | | | |
| දුරකථනය Telephone | 011-2801481, 0113-485402 | වෙබ් අඩවිය Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස් Fax | 011-2802753 | විද්‍යුත් තැපෑල E-mail | exams.edecu@sjp.ac.lk |


2026.01.14

ප්‍රිය ශිෂ්‍ය/ශිෂ්‍යාවනි

## සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි I පරීක්ෂණය - 2026 පෙබරවාරි

## 2017/2018/2019/2020/2021/2022/2023 පුනර් සිසුන් සඳහා අයදුම්පත් කැඳවීම

ඉහත පුනර් පරීක්ෂණයට අයදුම් කිරීමට සහ පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා පහත උපදෙස් අනුගමනය කරන ලෙස දන්වා සිටිමි.

| | |
|---|---|
| පරීක්ෂණය සඳහා අයදුම් කිරීම | ඔබගේ තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිස Examination හි ඇති Application Repeat වෙත පිවිස නැවත පෙනී සිටීමට අපේක්ෂා කරන විෂයයන් නිවැරදිව තෝරා යොමු කළ යුතු වේ. මාර්ගගත ක්‍රමවේදය හරහා අයදුම්පත් යොමු කළ (Apply) පසු ඔබ ඉල්ලුම් කළ පුනර් පරීක්ෂණයට අදාළ තොරතුරු Student Profile හරහා පරීක්ෂා කළ හැක. |
| පුනර් පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු ගිණුම් අංකය ලබා ගැනීම | පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා ඔබට අදාල ගිණුම් අංකය ඔබගේ තොරතුරු ගොනුව **(Student Profile)** වෙත පිවිස **Student** හි ඇති **Payments** මගින් ලබා ගත හැක**. ඕනෑම මහජන බැංකු ශාඛාවකින් හෝ මාස්ටර්/වීසා (Master/ Visa) (Credit හෝ Debit Card) මගින් ගෙවීම් කළ හැක.**<br><br>**(සැලකිය යුතුයි:** ගිණුම් අංකය ලබා ගැනීමේදී අනිවාර්යයෙන් **Reason for the payments** නිවැරදිව තෝරා ගත යුතුය) |
| පුනර් පරීක්ෂණ ගාස්තු | විෂයයන් 1ක් සඳහා රු. 5,000.00<br>විෂයයන් 2ක් සඳහා රු. 7,000.00<br>විෂයයන් 3ක් සඳහා රු. 9,000.00<br>විෂයයන් 4ක් සඳහා රු. 11,000.00<br>විෂයයන් 5ක හෝ ඊට වැඩි රු. 13,000.00 |
| 2025 මාර්තු/අප්‍රේල් පවත්වන ලද උපාධි I පරීක්ෂණයට අයදුම් කර වෛද්‍ය හේතු මත විභාගයට වරප්‍රසාද ලැබූ 2023 වර්ෂයේ ලියාපදිංචි අපේක්ෂකයන්ද පරීක්ෂණ ගාස්තු ගෙවීම අනිවාර්ය වේ. | |
| අයදුම්පත් යොමු කළ යුතු අවසාන දිනය | 2026 ජනවාරි 26 (රාත්‍රී 12.00 දක්වා) |

| ලියාපදිංචිය දීර්ඝ කිරීම | |
|---|---|
| **2017 වර්ෂයේ ලියාපදිංචි සිසුන්**<br>**2024-08-14** දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>**(ලියාපදිංචිය වාර 4 ක් අලුත් කර තිබිය යුතුය)** | ලියාපදිංචිය දීර්ඝ කිරීම පිලිබඳ විස්තර **www.external.sjp.ac.lk** **වෙබ් අඩවියේ සහ ඒ සඳහා මුදල් ගෙවිය යුතු ගිණුම් අංකය (Student Profile)** වෙත පිවිස **(Student)** හි ඇති **Payments** මගින් ලබා ගත හැක**. ඕනෑම මහජන බැංකු ශාඛාවකින් හෝ මාස්ටර්/වීසා (Master/ Visa) (Credit හෝ Debit Card) මගින් ගෙවීම් කළ හැක.**<br>(ගෙවීම් කරන ලද රිසිට් පත සහ ශිෂ්‍ය වාර්තා පොත තැපැල් මඟින් එවීම අවශ්‍ය නො**වන අතර** ගිණුම් අංකය ලබා ගැනීමේදී අනිවාර්යයෙන් **Reason for the payments** නිවැරදිව තෝරා ගත යුතුය**)** |
| **2018 වර්ෂයේ ලියාපදිංචි සිසුන්**<br>**2025-08-31** දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>**(ලියාපදිංචිය වාර 4 ක් අලුත් කර තිබිය යුතුය)** | |
| **2019 වර්ෂයේ ලියාපදිංචි සිසුන්**<br>**2025-06-30** දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>**(ලියාපදිංචිය වාර 3 ක් අලුත් කර තිබිය යුතුය)** | |
| **2020 වර්ෂයේ ලියාපදිංචි සිසුන්**<br>**2025-08-31** දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>**(ලියාපදිංචිය වාර 2 ක් අලුත් කර තිබිය යුතුය)** | |
| **2021 වර්ෂයේ ලියාපදිංචි සිසුන්**<br>**2026-01-31** දිනට වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය<br>**(ලියාපදිංචිය වාර 1 ක් අලුත් කර තිබිය යුතුය)** | |

**සැලකිය යුතුයි**

I. **2017 අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචි සිසුන් හට උපාධි I පරීක්ෂණය සඳහා පෙනී සිටිය හැකි අවසන් අවස්ථාව මෙය වේ .**

II. පරීක්ෂණ අයදුම්පත් යොමු කිරීමට ප්‍රථම පාඨමාලා ගාස්තු දෙවන හා තෙවන වාරිකය ද අදාළ පරිදි ලියාපදිංචිය දීර්ඝ කිරීමේ ගාස්තුද සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. එසේ ගෙවා නොමැති අයදුම්කරුවන්ට පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

III. අයදුම්පත් යොමු (Apply) කිරීමේ අවසන් දිනය **2026/01/26 (රාත්‍රී 12.00 දක්වා)** වන අතර එම දිනයෙන් පසුව කිසිදු හේතුවක් මත අයදුම්පත් භාරගනු නොලැබේ.

IV. පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා එක් අයදුම්කරුවෙකු වෙනුවෙන් සුවිශේෂී ගිණුම් අංකයක් බැගින් ඇති අතර අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතුය. ගාස්තු ගෙවීම, දිවයිනේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් සිදුකළ හැක. **(**ගෙවීම් කරන ලද රිසිට් පත ළග තබාගත යුතු අතර වෙනත් ගිණුම් අංක වලට ගෙවන ලද මුදල් පිළිබඳව විශ්වවිද්‍යාලය වග කියනු නොලැබේ.**)**

V. නියමිත පරිදි මුදල් නොගෙවන ලද අයදුම් කිරීම් නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VI. පරීක්ෂණයට අදාළ කාල සටහන **www.external.sjp.ac.lk** යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පල කරන අතර සියළු දැනුවත් කිරීම් වෙබ් අඩවිය/ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) හරහා පමණක් සිදු වේ.

VII. විදේශ ගත සිසුන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ පෙනී සිටිය හැක. ඒ සඳහා වන විස්තර **http://external.sjp.ac.lk/online-exminations-for-migrated-students/** යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

VIII. නියමිත දිනට ඉහත පරීක්ෂණය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ සිසුන්ගේ විභාග ප්‍රවේශපත්‍රය ඔබගේ තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිස Examination හි ඇති Admission වෙත පිවිස බාගත Download කර ගත හැක. විභාග ප්‍රවේශපත්‍ර තැපැල් මාර්ගයෙන් නිකුත් නොකරන බව කාරුණිකව සලකන්න.

IX. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය 428 වන සනාතන සභාව විසින් අනුමත කරන ලද සංශෝධිත නව විභාග නීති රීති මාලාව **external.sjp.ac.lk/bachelor-of-science-management-public-general-external-degree-exam-rules-and-regulations/** වෙත පිවිස පරිශීලනය කල හැක.

X. **උපාධියක් සම්පූර්ණ කිරීම :** උපාධිය ලැබීම සඳහා අවශ්‍යතාවන් පිළිබඳ විස්තර **www.external.sjp.ac.lk** වෙබ් අඩවියේ පල කර ඇති ඔබගේ අධ්‍යයන වර්ෂයට අදාළ ශිෂ්‍ය විවරණිකාව (Prospectus) පරිශීලනය කිරීමෙන් ඔබට ලබා ගත හැකිය.



නියෝජ්‍ය ලේඛකාධිකාරි
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2026.01.14